පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා අංක : 318

ආයතනයේ නම : ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 318**
**நிறுவனத்தின் பெயர்: இலங்கைப் பாராளுமன்றம்**

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சபா பீடத்திற்குச் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliament Series No.: 318
Name of the Institution: Parliament of Sri Lanka

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ස්ථාවර නියෝග අංක **119(4)** ප්‍රකාරව රාජ්‍ය ගිණුම් කාරක සභාව සභාගත කළ වාර්තාවට අදාළව පාර්ලිමේන්තු මහ ලේකම්ගේ නිරීක්ෂණ හා ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 318**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

| කමිටුව විසින් ලබාදෙන ලද නිර්දේශ | එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|
| විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස | (1) දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව ලෙස, මෙම කාරක සභා වාර්තාව 2025 ඔක්තෝබර් මස 24 පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සිදු කෙරුණි.<br><br>(2) ඉන් අනතුරුව එම කාරක සභා වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි විධිවිධාන ප්‍රකාරව නිරීක්ෂණ සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන්ට 2025 නොවැම්බර් 17 වන දින යොමු කරන ලදී.<br><br>(3) 2026 මාර්තු 04 දින වනවිට විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයාගේ නිරීක්ෂණ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබෙන අතර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සභානායකවරයා වෙත යොමුකළ බව දන්වා ඇත.<br>එමෙන්ම, මෙතෙක් වාර්තාවන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ කම්කරු අමාත්‍යාංශය හා ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත රජයේ ගිණුම් කාරක සභාව විසින් සිහිකැඳවීම් ලිපි යොමුකර ඇත.<br><br>(4) ඉහත සිහිකැඳවීම් ලිපිවලට ප්‍රතිචාර ලෙස අදාළ අමාත්‍යාංශ වලින් වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරියේදී ඉදිරිපත් කළපසු, ඒවා සලකා බැලීම සඳහා නැවත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරමි.<br><br>(5) එහිදී කාරක සභා වාර්තාවේ සඳහන් කරුණු සහ ලබා දී ඇති නිර්දේශයන් අනුව ලබා ඇති ප්‍රගතිය සමාලෝචනයෙන් පසු ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් තීරණයන්ට එළඹ, කාරක සභාව විසින් එකී තීරණ අනුසාරයෙන් සකස් කළ කාරක සභා නිර්දේශ, යෝජනාවක් ආකාරයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.<br><br>(6) ඉන් අනතුරුව එම කාරක සභා වාර්තාව සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමුකළ යුතු යැයි පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් සිදු වුවහොත් එම වාර්තාව නීතිපතිවරයා වෙත යොමු කිරීමට කටයුතු කරමි. |

පාර්ලිමේන්තුවේ මහ ලේකම්